## 176 – නිල් තණ ගොල්ලේ

නිල් තණ ගොල්ලේ මා සතපන්නෝ
සමිඳු එඬේරාණෝ
ආදර මුවිනේ වදන් සමන් මල්
මා හද පුබුදු කෙරේ //

දෑසම නොපියා නොනිදා සමිඳා
පා ලිස්සීමට නොම දෙයි කිසිදා //
ගලවයි නපුරෙන් යන එන මග මා
පැතුම් හැමට මගෙ ඔබ ඉටු දෙවිඳා

නිල් දිය අසලින් සිසිලක් දෙන්නයි
දඬු සැරයටියෙන් සැනසුම දෙන්නයි //
මා හිස තෙල් ගා පත උතුරා යයි
බිය වන්නේ නෑ ඔබ මා සමඟයි

සමිඳුගෙ දකුණ’ත සෙවන සදනවා
සිටිම් සැදී මම බලා සිටිනවා //
සන්තක කර හැම මග මා එනවා
මෙමට සතුට ඔබ වෙතම තිබෙනවා